# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව

# 2013


**177 , නාවල පාර**

**නාරාහේන්පිට**

**කොළඹ 05**

| | | |
|---|---|---|
| දුරකථන | - | **0112-136600 / 0112-136650 / 0112-136700** |
| ෆැක්ස් | - | **0112-369302 / 0112-369305** |
| ඊ මේල් | - | **secretary@psc.gov.lk** |
| වෙබ් | - | **www.psc.gov.lk** |

මගේ අංකය: PSC/ADM/06/02/05/2013
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
177, නාවල පාර
නාරාහේන්පිට
කොළඹ 05

2014 ජූලි මස 07 දින.

මහ ලේකම්,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

මහත්මයාණෙනි,

**<u>2013 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (5) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව 2013 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව මේ සමඟ ඔබ වෙත එවමි.

මෙයට - විශ්වාසී,

ටී.එම්.එල්.සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## දැක්ම

ජාතියේ විශිෂ්ටත්වය සඳහා කැපවූ රාජ්‍ය සේවයක්.

## මෙහෙවර

සාධාරණව, විනිවිද බවින් හා සමානුකූලව මහජනයාට සේවය කිරීමට, කාර්යක්ෂම, විනයගරුක සහ තෘප්තියට පත් රාජ්‍ය සේවයක් ස්ථාපනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්

## සභාපති

**විද්‍යාජෝති වෛද්‍ය දයාසිරි ප්‍රනාන්දු මහතා**

## සාමාජිකයන්

**ජනාධිපති නීතිඥ පාලිත එම්. කුමාරසිංහ මහතා**

**සිරිමාවෝ ඒ. විජේරත්න මහත්මිය**

**එස්.සී. මාන්නප්පෙරුම මහතා**

**ආනන්ද සෙනවිරත්න මහතා**

**එන්.එච්. පතිරණ මහතා**

**එස්. තිල්ලෙයිනඩරාජා මහතා**

**එම්.ඩී.ඩබ්ලිව්. ආරියවංශ මහතා**

**ඒ. මොහොමඩ් නහියා මහතා**

# පටුන


| අනු අංකය | | කාරණය | පිටුව |
|---|---|---|---|
| 1 | හැදින්වීම | | 1 |
| 2 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඓතිහාසික ගමන් මග | | 1 |
| 3 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල | | 2 |
| | 3.1 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ විමසුමට ලක්කළ හැකි අවස්ථා | 3 |
| 4 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය | | 3 |
| 5 | සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය විසින් ඉටු කරන ලද කටයුතු පිළිබඳ විස්තර | | 7 |
| | 5.1 | ආයතන අංශය | 7 |
| | 5.1.1 | ආයතන අංශයෙහි කාර්යභාරය | 8 |
| | 5.1.2 | ආයතන අංශයේ ප්‍රගති සමාලෝචනය (2013.01.01 – 2013.12.31) | 8 |
| | 5.1.3 | ආයතන අංශය මුහුණ දුන් අභියෝග ජය ගැනීමට හා කාර්ය සාධනය වැඩිකර ගැනීම සඳහා ගන්නා ලද නව ක්‍රියාමාර්ග | 13 |
| | 5.2 | පත්කිරීම් හා උසස් කිරීම් අංශය | 13 |
| | 5.2.1 | පත්කිරීම් හා උසස් කිරීම් අංශයෙහි කාර්යභාරය | 14 |
| | 5.2.2 | පත්කිරීම් හා උසස්කිරීම් අංශයේ ප්‍රගති සමාලෝචනය (2013.01.01 – 2013.12.31) | 15 |
| | 5.2.3 | 2013 වසරේ පත්වීම් අංශයේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය | 16 |
| | 5.3 | විනය අංශය | 27 |
| | 5.3.1 | විනය අංශයෙහි කාර්යභාරය | 27 |
| | 5.3.2 | විනය අංශයේ ප්‍රගති සමාලෝචනය (2013.01.01 – 2013.12.31) | 29 |
| | 5.3.3 | විනය අංශයේ කාර්ය සාධනය වැඩිකර ගැනීම සඳහා ගන්නා ලද නව ක්‍රියා මාර්ග | 30 |
| | 5.4 | අභියාචනා අංශය | 31 |
| | 5.4.1 | අභියාචනා අංශයෙහි කාර්යභාරය | 31 |
| | 5.4.2 | අභියාචනා අංශයේ ප්‍රගති සමාලෝචනය (2013.01.01 – 2013.12.31) | 32 |
| | 5.4.3 | 2013 වසරේ අභියාචනා අංශයේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය | 33 |
| | 5.5 | පාලන අංශය | 33 |
| | 5.6 | ගිණුම් අංශය | 34 |
| 6 | මුදල් ප්‍රතිපාදනය | | 34 |
| 7 | කාර්ය මණ්ඩලය | | 35 |
| | 7.1 | සංවිධාන සටහන | 35 |
| | 7.2 | කාර්ය මණ්ඩල සංයුතිය | 35 |
| | 7.3 | කාර්ය මණ්ඩල පුහුණු කටයුතු | 35 |
| 8 | 2013 වර්ෂය තුළ එක් එක් අංශය විසින් කරුණු ඉදිරිපත් කර ඇති නඩු ගණන | | 36 |
| 9 | කොමිෂන් සභා රැස්වීම් | | 36 |
| 10 | ස්තූතිය | | 36 |
| 11 | ඇමුණුම් | | 38-40 |

## 01. හැඳින්වීම

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සාමාජිකයින් සංඛ්‍යාවකගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ. 2011.05.13 දින සිට මෙම කොමිෂන් සභාව පත් කරනු ලැබ ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(5) අනු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2013 ජනවාරි 01 වන දින සිට 2013 දෙසැම්බර් 31 වන දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරයි.

## 02. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඓතිහාසික ගමන් මග

ශ්‍රී ලංකාව, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක්ව පැවති සමයේ දී, වර්ෂ 1946 මැයි මස 15 දිනැති ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාව මගින් ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදි. එමඟින්, රාජ්‍ය නිලධාරීන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරුකිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම් පිළිබඳ විධායක බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා දෙන ලදි.

වර්ෂ 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව සම්මත වීමත් සමඟ, එතෙක් වසර විසි හයක් පුරා ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව අහෝසි වූ අතර රාජ්‍ය සේවය පිළිබඳ අධිකාරි බලය අමාත්‍ය මණ්ඩලය වෙත පවරා දෙනු ලැබිණ.

වර්ෂ 1978 දී දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රතිෂ්ඨාපනය කරන ලද අතර, එම කොමිෂන් සභාව අභියාචනා බලධාරියා වශයෙන් පමණක් කටයුතු කරන ලදි. 1992 වර්ෂයේදී රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරීන්ගේ (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ සිට ඉහළ තනතුරු හැර) පත් කිරීම් , උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම පිළිබඳ විධායක බලතල අමාත්‍ය මණ්ඩලය විසින් පවරන ලද අභිනියෝජිත බලය ප්‍රකාරව මෙම කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලදි. කොමිෂන් සභාව හෝ එමඟින් බලය අභිනියෝජිත කමිටුවක් විසින් ගනු ලබන තීරණ වෙනස් කිරීමට, අමුතු කිරීමට හෝ අවලංගු කිරීමට ඉඩ සැලසෙන බලතල අමාත්‍ය මණ්ඩලය වෙත රඳවා ගනු ලැබිණ.

වර්ෂ 2001 දී, 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින්, රාජ්‍ය සේවය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එතෙක් පැවති IX වන පරිච්ඡේදය පරිච්ඡින්න කොට නව පරිච්ඡේදයක් ඇතුලත් කරන ලදි. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සාමාජිකයින් සංඛ්‍යාවකගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වූ අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ

නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබුණි. මෙම සංශෝධනය මඟින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තත්වය ප්‍රබල වෙනසකට භාජනය වූ අතර, ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, රාජ්‍ය සේවයේ පත්කිරීම්, උසස්කිරීම්, ස්ථාන මාරු කිරීම් හා විනය පාලනය කිරීම් පිළිබඳ අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී තිබුණු බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරිණි. තවද මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට වගකීමට හා පිළිතුරු දීමට බැඳී සිටින ආයතනයක් බවට පත්කෙරිණි.

වර්ෂ 2010 දී , 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ස්ථාපනය හා කර්තව්‍යයන්ට අදාළ කරුණු සංශෝධනය කරනු ලැබ ඇත. මෙය පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට පිළිතුරු දිය යුතු කොමිෂන් සභාවකි. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත වේ. ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ. ඔවුහු තෙවසරක කාල පරිච්ඡේදයක් සඳහා ස්වකීය ධුර හොබවන අතර, තවදුරටත් එවැනි එක් කාල පරිච්ඡේදයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සන් වනු ඇත.

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සංශෝධිත 55(1) අනු ව්‍යවස්ථාව අනුව අමාත්‍ය මණ්ඩලය විසින් රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුත්තේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, පොලිස් නිලධාරීන් ද ඇතුළු ව රාජ්‍ය නිලධාරීන් පත්කිරීම, උසස්කිරීම, ස්ථාන මාරුකිරීම හා ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම පිළිබඳ බලතල කොමිෂන් සභාව වෙත පවරා ඇත.

## 03. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල

18 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් පැවරී ඇති බලතල අනුව යුධ හමුදා, නාවික හමුදා හා ගුවන් හමුදා සාමාජිකයන් හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවලින් පත්කරන ලද පළාත් රාජ්‍ය සේවකයින්, ජනාධිපතිවරයා විසින් පත්කරන ලද අමාත්‍යංශ ලේකම් හා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද උපලේඛනගත නිලධාරීන් සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල ආයතන සේවකයන්ද හැර පළාත් සභාවල සේවය කරන දීප ව්‍යාප්ත සේවා වලට ගැනෙන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් ,

- පත්කිරීම
- උසස් කිරීම
- ස්ථාන මාරු කිරීම
- විනය පාලනය හා සේවයෙන් පහ කිරීම , රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි.

## 3.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ විමසුමට ලක්කළ හැකි අවස්ථා

පහත සඳහන් අවස්ථාවන්හි දී හැරුණ විට කොමිෂන් සභාවේ තීරණ කිසිදු අධිකරණයකදී හෝ විනිශ්චය සභාවකදී මත විමසුමකට ලක්කළ නොහැකිය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61 අ ව්‍යවස්ථාව අනුව 126 ව්‍යවස්ථාවේ (1) වන, (2) වන, (3) වන, (4) වන හා (5) වන ඡේදයන්හි විධිවිධානයන්ට යටත්ව, මූලික අයිතිවාසිකම් වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැමිණිලි කිරීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 (1) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව හා 2002 අංක 4 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතින් ස්ථාපනය කරන ලද පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනය කිරීම.

# 04. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය

2013 ජනවාරි මස 01 දින සිට 2013 දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමස්ත ශ්‍රී ලාංකික ජාතියේ උන්නතියත්, මාතෘ භූමියේ සංවර්ධනයත් උදෙසා ගෞරවනීය රාජ්‍ය සේවයක් ඇතිකරලීමේ හා පවත්වා ගෙන යාමේ තිර අදිටනින් විනිවිදභාවය හා අවංකභාවය පෙරදැරි කර ගෙන තම කටයුතු කරගෙන යන ලදී.

රාජ්‍ය සේවයේ බඳවාගැනීම් හා උසස්කිරීම් සම්බන්ධයෙන් වන විවිධ බාධක ඉවත්කර, ගුණාත්මක රාජ්‍ය සේවයක් සුරක්ෂිත කිරීමේ මෙන්ම විවිධ වෘත්තීන්ට හා සේවාවන්ට අදාළ වන පරිදි ඒ ඒ වෘත්තීන්හි හෝ සේවාවන්හි කාර්යක්ෂමතාව හා කාර්යසාධනය වර්ධනය කිරීමේ ද අරමුණ පෙරදැරිව එකී බඳවා ගැනීම් පටිපාටි හා සේවා ව්‍යවස්ථාවන් ගැඹුරින් අධ්‍යයනය කරමින් හා අවශ්‍ය සංශෝධන සිදුකරමින් ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇත. ගැටලුකාරී තත්වයන් පැන නැගුණ සෑම අවස්ථාවක දීම අමාත්‍යංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට කැඳවා සභාපති ප්‍රමුඛ කොමිෂන් සභාවේ සාමාජිකයන් හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ඇතුළු ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්ද සමග සාකච්ඡා වට පවත්වා සාමූහික එකඟතාවයකට පැමිණෙමින් කඩිනමින් අවශ්‍ය පිළියම් යෙදීමට කටයුතු කරන ලදී.

රාජ්‍ය සේවයේ විධායක මට්ටමේ සේවාවන් සඳහා බඳවා ගැනීමේදී හා උසස් කිරීමේදී දැනුම, කුසලතාවය, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්දට නිසි අවධානය යොමුවූ අතර තරගකාරී හා විනිවිදභාවයෙන් යුක්තව තෝරාගැනීම් සිදුකෙරිණි. නිසි කලට පත් කිරීම් හා උසස් කිරීම් සිදුකර නිලධාරීන්ගේ අභිප්‍රේරණය වර්ධනය වන අයුරින් කටයුතු කරමින් දැනුම, කුසලතාව හා යහපත් ආකල්ප හෙබි තරුණ පිරිසක් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට මෙන්ම තනතුරු වලට සුදුසුම නිලධාරීන් පත් කිරීමට හා උසස් කිරීමට ද ඉහළ වෘත්තීය මට්ටමකින් ක්‍රියා කරන ලදී.

රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් බලාපොරොත්තු වූ අපේක්ෂිත චර්යාධර්ම කඩකළ නිලධාරීන්ට විරුද්ධව කටයුතු කිරීමේදී අවශ්‍ය සියලු තොරතුරු මැනවින් හා ගැඹුරින් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව සමරූපීතාවය පවත්වා ගනිමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග ලබා දී ඇත. එතකුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව රජයේ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමේ දී අදාළ විනය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ඒ ඒ අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු වෙතින් කැඳවනු ලබන නිරීක්ෂණ, නිර්දේශ සහ වාර්තා බොහෝ අවස්ථාවලදී ප්‍රමාදවීම මෙන්ම, ඇතැම් අවස්ථාවලදී අසම්පූර්ණ තොරතුරු වාර්තා කිරීම හේතුවෙන් එක් එක් නිලධාරීන් සම්බන්ධයෙන් අදාළ විනය කරුණු පිළිබඳව කඩිනමින් කටයුතු කිරීමෙන් වැලකී නිවැරදි තොරතුරු වාර්තා වන තෙක් බලා සිටීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට සිදුවිය. එහි අවසාන ප්‍රතිඵලය වන්නේ කොමිෂන් සභාව විසින් ලබා දියයුතු වන අවසාන තීරණය ප්‍රමාද වීමයි. (උදාහරණය :- විනය කරුණු මත ස්ථාන මාරු කිරීමට හෝ වැඩ තහනම් කිරීමට නිර්දේශ ඉදිරිපත් කරන නමුත් ඊට පදනම් වන කරුණු කිසිවක් පැහැදිළි නොකිරීම හා මූලික විමර්ශන වාර්තා නොඑවීම, මූලික විමර්ශන වාර්තා එවූව ද සටහන් කරගත් ප්‍රකාශ හා / හෝ අත් අඩංගුවට ගත් ලේඛන / භාණ්ඩ ඉදිරිපත් නොකිරීම දැක්විය හැකිය.)

කොමිෂන් සභාව වෙත ලැබෙන අසම්පූර්ණ වාර්තා විශේෂයෙන් මූලික විමර්ශන වාර්තා අධ්‍යයනය කිරීමේ දී රජයේ විනය ක්‍රියාමාර්ග හා විනය කාර්ය කළමනාකරණය පිළිබඳව වන අවම දැනුම හා ඒ හේතුවෙන් සිදුවන අඩුපාඩු රැසක් ඇති බව පැහැදිළි වේ. රජයේ දෙපාර්තමේන්තු සහ අමාත්‍යංශ විසින් විනය කාර්ය කළමනාකරණය පිළිබඳව එම විෂය සම්බන්ධයෙන් වගකීම් දරන නිලධාරි පිරිස පමණක්වත් වාර්ෂිකව විධිමත් පුහුණුවකට යොමු කරන්නේ නම් එම අඩු පාඩු මගහරවා ගැනීමටත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රමාද අවම කර ගැනීමටත් ඉඩ ප්‍රස්ථාව උදා වනු ඇත. අමාත්‍යංශ වල අතිරේක ලේකම්වරුන් කැඳවා පවත්වනු ලැබූ වාර්ෂික රැස්වීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව එම කරුණ පිළිබඳව අවධාරණය කර ඇත.

නොයෙකුත් තත්වයන් යටතේ තමන්ට අගතියක් වූ බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනා ඉදිරිපත් කළ රජයේ නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධයෙන් අදාළ විස්තර මැනවින් විශ්ලේෂණය කොට යුක්තිය හා සාධාරණත්වය ඉටුවන පරිදි තීරණ ලබා දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිරන්තරයෙන් කටයුතු කළේය. එමගින් රාජ්‍ය සේවයේ සියලු තරාතිරම්වල නිලධරයන් මුහුණ දෙන සේවා ගැටලු සම්බන්ධයෙන් සාධාරණ අභියාචනා අවස්ථාවක් සුරක්ෂිත කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කර ඇත.

සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව අමාත්‍යංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගෙන්වා සාකච්ඡා කිරීමට අමතරව රාජ්‍ය සේවා කොමිෂන් සභා උපදෙස් හා චක්‍රලේඛ මෙන්ම අදාල කාර්යාල කටයුතුවලට සම්බන්ධ ගැසට් නිවේදනද නිකුත් කර ඇත. ඊට අමතරව මාර්ගෝපදේශ හා ආකෘතිපත්‍ර සෑම දෙනාගේම දැනගැනීම හා පහසුවෙන් ප්‍රයෝජනයට ගැනීමට හැකිවන අයුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියට ඇතුළත් කර ඇත. මීට අමතරව වාර්ෂිකව පවත්වනු ලබන අමාත්‍යංශ අතිරේක

ලේකම්වරුන්ගේ සමාලෝචන රැස්වීම 2013 ජනවාරි මාසයේදී පැවැත්වුනි. මෙහිදී එම නිලධාරීන් හට ඇති ගැටළු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලද අතර ඉන් අනතුරුව ඔවුන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය විසඳුම් ලබා දුනි.

2013 වසර තුළදී සමස්ත රාජ්‍ය සේවය සඳහා නව කාර්යසාධන කළමනාකරණ ක්‍රමවේදයක් සැකසීම සඳහා කටයුතු ආරම්භ කරන ලදි. විය වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය, රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ දකුණු ආසියානු සංවර්ධනීය හවුල් ක්‍රියාකාරිත්වයේ ADB-Aus AID ආධාර ක්‍රමයේ සහයෝගිත්වයෙන් ආරම්භ කරන ලදි. ඒ පිළිබඳව සමස්ත රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සඳහා ජාතික සමුළුවක් 2013.07.11 දින කොළඹ දී පවත්වන ලදි. ඉන් අනතුරුව තෝරාගත් ආයතන 15 ක් යොදා ගෙන නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලද අතර 2014 වසර තුළදී එහි ප්‍රගතිය පිළිබඳ සමාලෝචනයක් කිරීමට නියමිතය. ඉන් අනතුරුව සමස්ත රාජ්‍ය සේවය සඳහා විය අදාළ කර ගැනීමට අපේක්ෂිතය. මෙම මූලාරම්භය 2013 වර්ෂය තුළ සනිටුහන් වූ සුවිශේෂී කටයුත්තක් වූයේය.

මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කරන පැමිණිලි සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිරන්තරයෙන් කරුණු ඉදිරිපත් කරන අතර සියලු කාරණා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අවධානය යොමුකර පවත්නා නීතිමය රාමුව යටතේ ලබා දිය හැකි උපරිම සහන ලබා දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කර ඇත. මහජන පෙත්සම් කාරක සභාව විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන සියලුම මහජන පෙත්සම් මනා අයුරින් අධ්‍යයනය කර ඒ පිළිබඳව සවිස්තරාත්මක වාර්තා මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමටත්, විවිධ අවස්ථාවල කරනු ලබන දැනුම් දීම් පරිදි අදාළ නිලධාරීන් මහජන පෙත්සම් කාරක සභාව ඉදිරියේ කරුණු දැක්වීම සඳහා යොමු කිරීමටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කර ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අදාළව කාර්යාලය වෙත දෛනිකව ලැබෙන ලිපි ලේඛන කළමනාකරණ පද්ධතියක් හරහා පරිගණක ගත කරනු ලබයි. මෙහිදී ලිපිය පිළිබඳ වැදගත් තොරතුරු සියල්ල පරිගණක ගත කරනු ලබන අතර සෑම ලිපියකටම අනන්‍යවූ අංකයක් ලබා දේ.

ජාලගත කරන ලද පරිගණක පද්ධතිය තුළින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සියලුම පරිගණක එකිනෙක සම්බන්ධ කර ඇති බැවින් කාර්යාලය වෙත ලැබෙන ලිපි මෙම පද්ධතිය හරහා අදාළ අංශ වෙත යොමු කිරීමෙන් අනතුරුව එක් එක් ලිපිය සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග සියල්ල පියවරෙන් පියවරට සුපරීක්ෂණය කරමින් යාවත්කාලීන කළ හැකි වන අතර, එමගින් යම් ලිපියක් සම්බන්ධයෙන් විමසීම් කරන අයෙකුට ලේඛන කළමනාකරණ පද්ධතිය භාවිතා කරමින් එම ලිපිය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ගයේ වර්තමාන තත්වය පිළිබඳව කඩිනමින් පැහැදිලි විස්තරයක් ලබා දීමටද හැකි වේ.

මහා භාණ්ඩාගාර පරිශ්‍රයේ ස්ථානගත කර තිබූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය 1997 වර්ෂයේ ඔක්තෝබර් මස සිට මේ දක්වා වරින් වර විවිධ ස්ථාන හතක පවත්වාගෙන ගොස්

තිබේ. මේ තත්ත්වය මත ලී බඩු හා කාර්යාලයීය උපකරණ ප්‍රවාහනය කිරීමට විශාල ලෙස වියදම් දරා ඇති අතර කාර්යාල ගොඩනැගිලි සඳහා මාසික කුලිය වශයෙන්ද විශාල මුදලක් වියදම් කර ඇත. එබැවින් 2013 වසරේදී ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යංශයට යාබදව පිහිටා තිබෙන පිඹුරු අංක මු.කො.පි. 9175 හි කැබලි අංක 19 හා 20 මගින් දැක්වෙන හෙක්ටයාර් 0.1770 ක් වූ ප්‍රමාණයේ රජයට අයත් බිම් කොටසක්, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදි කිරීම පිණිස වෙන්කර දී ඇත.

ඒ අනුව, නව කාර්යාල ගොඩනැගිල්ල සඳහා වන ඇස්තමේන්තුගත වියදම වන රුපියල් මිලියන 670 ක මුදල සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර අදාළ ඉදිකිරීම් කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුකිරීමටත්, 2014 වර්ෂයේ පළමු කාර්තුව තුළ වැඩ ආරම්භ කිරීමටත් සැලසුම් කෙරිණි.

තවද, ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානයේ ISO 9001:2008 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තුළ තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කර, පවත්වාගෙන යාමටත්, මෙම වසර තුළ එකී තත්ත්ව සහතිකය ලබා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය සියලුම මූලික කටයුතු ඉටුකිරීමටත් සුදුසු පරිදි ක්‍රියා කර ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් රාජ්‍ය නිලධාරීන් වෙත ඉටු කරනු ලබන සේවය පිළිබඳ ඔවුන්ට තොරතුරු ලබා දීම සඳහා පුළුල් වැඩ පිළිවෙලක් දැන් ක්‍රියාත්මක වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ/ නිවේදන/නීති රෙගුලාසි/කාර්ය පටිපාටි පිළිබඳව තොරතුරු රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියට ඇතුළත් කිරීම තුළින් වඩාත් ඉක්මනින් හා පහසුවෙන් එම තොරතුරු ලබා ගැනීමේ හැකියාව ලැබී ඇත.

එමෙන්ම සෑම සතියකම බදාදා දිනය, මහජන දිනය ලෙස ක්‍රියාත්මක වේ. එම දිනය තුළ, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය කරා පැමිණ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකර ඇති තම කරුණු සම්බන්ධයෙන් විමසා බැලීමට රාජ්‍ය නිලධාරීන්ට අවස්ථාව සලසා දී ඇති අතර ඒ වෙනුවෙන් හඳුන්වා දී ඇති විධිමත් ආකෘති පත්‍රයක් නිසි පරිදි පුරවා අයදුම් කර එදින මහජන දිනය මෙහෙයවන අදාළ සහකාර ලේකම් වරයා හමුවීම මගින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ඔවුනට පුළුවන.

රාජ්‍ය සේවා කොමිෂන් සභා නිලධාරීන්ගේ සුභසාධනය සඳහාත්, ක්‍රීඩා හා විනෝදාස්වාදය සඳහාත් කාර්යාලයීය සුභ සාධක සංගමය මගින් විවිධ වැඩසටහන් ඉතා ඉහළ මට්ටමින් සංවිධානය කෙරිණි. සුභ සාධක සංගමය විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික විනෝද චාරිකාව , අවුරුදු උත්සවය ,වෙසක් දන්සැල හා කලා හැකියාවන් විදහා දක්වන ගී ගොනුව ප්‍රසංගය වැනි ක්‍රියාකාරකම් මෙම වසර තුළදීත් සාර්ථකව සිදු කෙරිණි.

# 05. සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය විසින් ඉටු කරන ලද කටයුතු පිළිබඳ විස්තර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් අංශයන් ස්ථාපිත කොට අවශ්‍ය දායකත්වය ලබා ගෙන ඇත.

- ආයතන අංශය
- පත්කිරීම් හා උසස්කිරීම් අංශය
- විනය අංශය
- අභියාචනා අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය

## 5.1 ආයතන අංශය

ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ආ ව්‍යවස්ථාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයෙන් විධිවිධාන සලසනු ලබන තෙක්, ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනයේ දී රාජ්‍ය සේවයට අදාළව බලාත්මකව පැවති සියලු රීති, නියෝග හා කාර්ය පටිපාටි, එම පරිච්ඡේදය යටතේ රාජ්‍ය සේවයට සම්බන්ධව සාදනු ලැබූ හෝ විධිවිධාන සලස්වනු ලැබූ රීති, නියෝග හා කාර්ය පටිපාටි අවශ්‍ය වෙනස් කිරීම් සහිතව බලාත්මකව පවතින ලෙස සැලකිය යුතු බව සඳහන් වී ඇත.

ඒ අනුව රාජ්‍ය සේවයට අදාළ රීති, නියෝග හා කාර්ය පටිපාටි පිළිබඳ විධිවිධාන සැලැස්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙහි ආයතන අංශය විසින් ඉටු කරනු ලැබේ.

ආයතන අංශය සඳහා අනුමත තනතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| අතිරේක ලේකම් | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 |
| සහකාර ලේකම් | 04 |
| කළමනාකරණ සහකාර | 08 |

## 5.1.1 ආයතන අංශයෙහි කාර්යභාරය

- රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයට අයත් බලය, වගකීම් සහ බලතල පැවරීමට අදාළ කටයුතු.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සම්පාදනය, සංශෝධනය හා ප්‍රසිද්ධ කිරීම.
- රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති පදනම් කරගත් උපදෙස් මාලා සකස් කිරීම සහ ඒ සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.
- චක්‍රලේඛ, නියෝග හා උපදෙස් නිකුත් කිරීම.
- රාජ්‍ය සේවයට අදාළ සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම සහ සංශෝධනය කිරීම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි, චක්‍රලේඛ සහ නියෝගවලින් බැහැර වන අවස්ථාවලදී ඒ පිළිබඳ කටයුතු කිරීම.
- කාර්ය පටිපාටික රීති වලට ආවරණය නොවන කරුණු සම්බන්ධව කටයුතු කිරීම.
- රාජ්‍ය සේවයට අදාළ කාර්ය පටිපාටික රීති වලට අනුව දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම, යථාවත් කිරීම, පවත්වා ගෙන යාම සහ තොරතුරු බෙදා හැරීම.
- රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරු පටිපාටි සකස් කිරීම හා සංශෝධනය කිරීම.

## 5.1.2 ආයතන අංශයේ ප්‍රගති සමාලෝචනය (2013.01.01 – 2013.12.31)

ඉහත කාල සීමාව තුළ පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇත.

| | කාරණය | එකතුව |
|---|---|---|
| 1 | නව බඳවා ගැනීම් පටිපාටි | 231 |
| 2 | නව සේවා ව්‍යවස්ථා | 10 |
| 3 | බඳවා ගැනීම් පටිපාටි සංශෝධනය | 21 |
| 4 | සේවා ව්‍යවස්ථා සංශෝධනය | 10 |
| 5 | ස්ථාන මාරු පටිපාටි | 6 |
| 6 | චක්‍රලේඛ | 1 |
| 7 | විශේෂ අවස්ථාවන්හිදී බඳවා ගැනීම් පටිපාටි වලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම් | 16 |
| 8 | විශේෂ අවස්ථාවන්හිදී සේවා ව්‍යවස්ථා වලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම්. | 5 |
| 9 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට අදාළ කරුණු | 2 |
| 10 | ප්‍රතිපත්ති සම්බන්ධ කටයුතු | 145 |
| 11 | පොදු කරුණු | 73 |
| 12 | ශ්‍රේෂ්ඨාධිකරණය, පරි.අභි.විනි.අධිකාරය, අභියාචනාධිකරණය සම්බන්ධ කරුණු | 8 |
| | **එකතුව** | **528** |

වගුව අංක 01




රූප සටහන අංක 01

## 2013.01.01 සිට 2013.12.31 දක්වා අනුමත කරන ලද බඳවාගැනීමේ පටිපාටි

| අනු අංකය | අමාත්‍යංශය | අනුමත කරන ලද ප්‍රමාණය |
|---|---|---|
| 1 | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන | 7 |
| 2 | මුදල් හා ක්‍රම සම්පාදන | 5 |
| 3 | මහාමාර්ග, වරාය හා නාවික | 0 |
| 4 | බුද්ධශාසන හා ආගමික කටයුතු | 0 |
| 5 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ | 9 |
| 6 | සෞඛ්‍ය | 5 |
| 7 | ඛණිජ තෙල් කර්මාන්ත | 1 |
| 8 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන | 5 |
| 9 | ජල සම්පාදන හා ජලාපවහන | 1 |
| 10 | සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන | 0 |
| 11 | පළාත් පාලන හා පළාත් සභා | 0 |
| 12 | කර්මාන්ත හා වාණිජ කටයුතු | 1 |
| 13 | විදුලි බල හා බලශක්ති | 1 |
| 14 | ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් | 8 |
| 15 | අධිකරණ | 10 |
| 16 | ආර්ථික සංවර්ධන | 6 |
| 17 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා | 6 |
| 18 | උසස් අධ්‍යාපන | 2 |
| 19 | විදේශ කටයුතු | 5 |
| 20 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු | 6 |
| 21 | පාර්ලිමේන්තු කටයුතු | 0 |

| | | |
|---|---|---|
| 22 | තැපැල් සේවා | 2 |
| 23 | ජාතික උරුමයන් පිළිබඳ | 2 |
| 24 | පරිසර හා පුනර්ජනනීය බලශක්ති | 12 |
| 25 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු | 5 |
| 26 | කම්කරු හා කම්කරු සබඳතා | 12 |
| 27 | අධ්‍යාපන | 3 |
| 28 | වැවිලි කර්මාන්ත | 1 |
| 29 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන | 6 |
| 30 | ඉඩම් හා ඉඩම් සංවර්ධන | 12 |
| 31 | සමාජ සේවා | 0 |
| 32 | ක්‍රීඩා | 3 |
| 33 | කෘෂිකර්ම | 9 |
| 34 | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති | 16 |
| 35 | ප්‍රවාහන | 4 |
| 36 | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන | 18 |
| 37 | සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ | 1 |
| 38 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ | 2 |
| 39 | දේශීය වෛද්‍ය | 7 |
| 40 | සුළු අපනයන භෝග ප්‍රවර්ධන | 9 |
| 41 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන | 1 |
| 42 | සිවිල් ගුවන් සේවා | 1 |
| 43 | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන | 0 |
| 44 | සංස්කෘතික හා කලා කටයුතු | 1 |
| 45 | ආපදා කළමනාකරණ | 3 |
| 46 | වනජීවී සම්පත් සංරක්ෂණ | 1 |

| අනු අංකය | අමාත්‍යංශය | අනුමත කරන ලද ප්‍රමාණය |
|---|---|---|
| 47 | නැවත පදිංචි කිරීමේ | 1 |
| 48 | මහජන සම්බන්ධතා හා මහජන කටයුතු | 0 |
| 49 | පුද්ගලික ප්‍රවාහන සේවා | 0 |
| 50 | රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන | 1 |
| 51 | විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ | 0 |
| 52 | තාක්ෂණ හා පර්යේෂණ | 6 |
| 53 | ඵලදායිතා ප්‍රවර්ධන | 0 |
| 54 | රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ | 0 |
| 55 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | 2 |
| 56 | ජනාධිපති කාර්යාලය | 1 |
| 57 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 2 |
| 58 | උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු | 5 |
| 59 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | 0 |
| 60 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 0 |
| 61 | නීතිය හා සාමය පිළිබඳ | 4 |
| **එකතුව** | | **231** |

වගුව අංක 02

## 2013 වර්ෂයේ සංශෝධනය කරන ලද බඳවාගැනීමේ පටිපාටි .

1. කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යංශයේ SL-01 අධ්‍යක්ෂ තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
2. ප්‍රවාහන අමාත්‍යංශයේ SL-01 නීති නිලධාරී තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය (වයස සංශෝධනය)
3. සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යංශයේ PL-02- 2006A තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
4. නැවත පදිංචි කිරීමේ අමාත්‍යංශයේ වීඩියෝ කැමරා ක්‍රියාකරු සහායක තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
5. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ SL-01 සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
6. තැපැල් දෙපාර්තමේන්තුවේ PL-03- 2006A රියදුරු තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
7. ප්‍රවාහන අමාත්‍යංශයේ SL-01 නීති නිලධාරී තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය (ලකුණු පටිපාටි සංශෝධනය)
8. පරිසර අමාත්‍යංශයේ SL-01 සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
9. අධ්‍යාපන අමාත්‍යංශයේ SL-01 නීති නිලධාරී තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
10. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ MN-01-2006A ලේඛන සහකාර තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
11. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ PL-01- 2006A සත්ව පාලන සහායක තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
12. සෞඛ්‍ය අමාත්‍යංශයේ MN-05 2006A පෝෂණවේදී තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
13. සෞඛ්‍ය අමාත්‍යංශයේ MN-01- 2006A නිවාස භාරකාරිණී තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
14. සමාජ සේවා දෙපාර්තමේන්තුවේ MT-01 2006A වෘත්තීය උපදේශක තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
15. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ SL-01 නීති නිලධාරී තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
16. හින්දු ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ PL-01- 2006A ආරක්ෂක නියාමක තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
17. කම්කරු දෙපාර්තමේන්තුවේ MN-01- 2006A ලසු ලේඛක තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
18. කම්කරු දෙපාර්තමේන්තුවේ SL-01 නියෝජ්‍ය කම්කරු කොමසාරිස් තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
19. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ MN-01- 2006A කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
20. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ SL-01 අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය
21. කම්කරු දෙපාර්තමේන්තුවේ SL-01 නීති නිලධාරී තනතුර සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය

## 2013 වර්ෂයට අදාළ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ

(i) 01/2013 - බඳවාගැනීමේ පටිපාටිවල සහ සේවා ව්‍යවස්ථාවල සඳහන් සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමට අදාළ විධිවිධාන පිළිබඳව තීරණය කිරීම.

## 2013 වර්ෂයේ සංශෝධනය කරන ලද සේවා ව්‍යවස්ථා

1. හෙද සේවා ව්‍යවස්ථාව - දෙවරක් සංශෝධනය කර ඇත
2. මැනුම් ක්ෂේත්‍ර සහායක සේවා ව්‍යවස්ථාව
3. කා.සේ.සේ ව්‍යවස්ථාව - දෙවරක් සංශෝධනය කර ඇත
4. දේශීය ආදායම් සේවා ව්‍යවස්ථාව
5. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා ව්‍යවස්ථාව
6. වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථාව
7. ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථාව
8. කෘෂිකර්ම සේවා ව්‍යවස්ථාව

## 2013 වර්ෂයේ අනුමත කරන ලද ස්ථානමාරු පටිපාටි

1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (විශේෂ ශ්‍රේණියේ) ස්ථානමාරු පටිපාටිය
2. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ස්ථානමාරු පටිපාටිය
3. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ස්ථානමාරු පටිපාටිය
4. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ස්ථානමාරු පටිපාටිය
5. ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක සහ ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහායක නිලධාරීන්ගේ ස්ථානමාරු පටිපාටිය
6. ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ සේවයේ ස්ථාන මාරු පටිපාටිය

## 2013.01.01 සිට 2013.12.31 දක්වා කාලය තුල අනුමත කරන ලද සේවා ව්‍යවස්ථා

1. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය
2. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය
3. ශ්‍රී ලංකා තාක්ෂණ සේවය
4. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය
5. ඒකාබද්ධ රියදුරු සේවය
6. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය
7. ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය

8. ශ්‍රී ලංකා සාමාන්‍ය අධ්‍යාපනික ගුරු සේවය
9. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය
10. ශ්‍රී ලංකා වෛද්‍ය සේවය

## 5.1.3 ආයතන අංශය මුහුණ දුන් අභියෝග ජය ගැනීමට හා කාර්ය සාධනය වැඩිකර ගැනීම සඳහා ගන්නා ලද නව ක්‍රියාමාර්ග

අ) බඳවා ගැනීමේ පටිපාටි, සේවා ව්‍යවස්ථා සම්බන්ධව කටයුතු කිරීමේදී පැන නගින ගැටළු සාකච්ඡා කිරීම සඳහා අදාළ ආයතන වල නිලධාරීන් සමග අවශ්‍ය අවස්ථාවන්හිදී රැස්වීම් පවත්වා විසඳුම් ලබා ගැනීමට කටයුතු කිරීම.

ආ) ආයතන අංශයෙන් අනුමත කර සහතික කරනු ලබන සියලුම බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථා, අනෙකුත් අංශවල පරිශීලනයට පහසුකම් සැලසීම (Scan කර Knowledge Share folder යට දැමීම මඟින්).

ඇ) කොමිෂන් සභාවට අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටි වල මෘදු පිටපත් ගෙන්වා ගැනීම සහ තවදුරටත් අවශ්‍ය වන සංශෝධන ඇතුළත් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලද පසු විද්‍යුත් තැපෑල මඟින්ම සංශෝධිත මෘදු පිටපත අදාළ දෙපාර්තමේන්තුව / අමාත්‍යංශය වෙත යොමු කිරීමට කටයුතු කිරීම.

ඈ) ISO - තත්ත්ව සහතික ලබාගැනීමේ වැඩ පිළිවෙල යටතේ ඒ ඒ කාර්යන් සඳහා තත්ත්ව සැලසුම් සකස්කිරීම. එහි සඳහන් කාලරාමුවලට අනුව කාර්යන් ඉටුකරන ලෙස නිලධාරීන් දැනුවත් කිරීම.

මෙම කාර්යයන් ඉටුකිරීමේදී මුහුණ දුන් අභියෝග

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අනුව රජයේ නිලධාරීන් පිළිබඳ තොරතුරු රැස්කිරීමට අදාළ කටයුතු, සාමාන්‍ය රාජකාරි පවරා ඇති කළමනාකරණ සහකාර නිලධාරීන්ගෙන්ම ඉටුකර ගැනීමට සිදුවීම හේතුවෙන් සහ ඔවුනගේ එදිනෙදා රාජකාරි සම්බන්ධව පැවැති කාර්ය බහුල බව හේතුවෙන් සම්පූර්ණ කිරීමට නොහැකි විය.

## 5.2 පත්කිරීම් හා උසස් කිරීම් අංශය

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි අංක 1733/52 හා 2011.11.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පවරා නොමැති, රාජ්‍ය නිලධාරීන් (අමාත්‍යංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ සේවයේ නිලධාරීන් හැර) සම්බන්ධයෙන් වන පත්කිරීම් හා උසස් කිරීම් පිළිබඳ පහත දැක්වෙන කර්තව්‍යයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පත්කිරීම් හා උසස් කිරීම් අංශය මගින් ඉටුකරනු ලැබේ. මෙම අංශය සඳහා අනුමත නිලධාරි මණ්ඩලය පහත පරිදි වේ.

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 02 |
| සහකාර ලේකම් | 09 |
| පරිපාලන නිලධාරී | 01 |
| කළමනාකරණ සහකාර | 23 |

## 5.2.1 පත්කිරීම් හා උසස් කිරීම් අංශයෙහි කාර්යභාරය

පත්කිරීම් හා උසස්කිරීම් අංශයේ කාර්යභාරය පහත සඳහන් පරිදි ප්‍රධාන අංශ දෙකක් යටතේ සිදු කෙරේ.

### I. පත්කිරීම්

අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීම්/ උසස්කිරීම් පටිපාටි අනුව බඳවා ගැනීම, සේවයේ ස්ථිර කිරීම, සේවය අවසන් කිරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම, වැඩබැලීමේ/ රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත්කිරීම, මුදාහැරීම (ස්ථිර/ තාවකාලික), කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම, සේවයෙන් ඉල්ලා අස්වීම, සේවයට/ තනතුරට නැවත පත්කිරීම, විශ්‍රාම ගැන්වීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 අනුව, වෛකල්පිත/ අනිවාර්ය/ වෛද්‍ය හේතූන් පදනම මත), විශ්‍රාම ගිය රාජ්‍ය නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම, සේවා ව්‍යවස්ථාවන්හි උපලේඛනගත තනතුරුවලට (අදාළ අවස්ථාවන්හිදී) පත්කිරීම.

### II. උසස් කිරීම්

අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීම් පටිපාටි අනුව උසස් කිරීම ( ශ්‍රේණියෙන් ශ්‍රේණියට / ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත) , තනතුරු වලට පත් කිරීම. (ජ්‍යෙෂ්ඨතාවය මත / ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල වලට අනුව)

ඉහත සඳහන් කර්තව්‍යයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබ ඇති නියෝග/ තීරණවලට විරෙහිව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හා අභියාචනාධිකරණයෙහි ගොනුකරනු ලබන නඩු අයදුම්පත් සම්බන්ධයෙන්ද කටයුතු කරනු ලැබේ.

# 5.2.2. පත්කිරීම් හා උසස්කිරීම් අංශයේ ප්‍රගති සමාලෝචනය (2013.01.01 – 2013.12.31)

| | කාරණය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | විශ්‍රාම ගැන්වීම් | 778 |
| 2 | ස්ථිර කිරීම් | 2153 |
| 3 | බඳවා ගැනීම් | 2201 |
| 4 | ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම් | 1506 |
| 5 | තෝරාගැනීම් මත උසස් කිරීම් | 619 |
| 6 | කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම | 616 |
| 7 | කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම් | 23 |
| 8 | කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ තීරණ | 1638 |
| 9 | වැඩ බැලීමට /රාජකාරි ඉටුකිරීමට පත් කිරීම් | 612 |
| 10 | මුදා හැරීම් | 161 |
| 11 | ඉල්ලා අස්වීම් | 43 |
| 12 | තනතුරු වලට පත් කිරීම් | 344 |
| 13 | අන්තර්ග්‍රහනය කිරීම් | 1471 |
| 14 | අභියාචනා | 348 |
| | එකතුව | 12513 |

වගුව අංක 03




රූප සටහන අංක 02

සමාලෝචිත කාලය තුළ කටයුතු කළ අධිකරණ නඩු ගණන

| | මුළු සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණ නඩු | 75 |
| අභියාචනාධිකරණ නඩු | 16 |
| පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර පැමිණිලි | 144 |

## 5.2.3. 2013 වසරේ පත්කිරීම් හා උසස් කිරීම් අංශයේ කටයුතු පිළිබඳ පොදු සමාලෝචනය

රාජ්‍ය සේවයේ ඉහල මට්ටමේ තනතුරු වලට / ශ්‍රේණිවලට පත් කිරීමේ දී / උසස් කිරීමේ දී අදාළ නිලධාරීන්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් මෙන්ම විවිධ තනතුරුවල සේවය කිරීමේ පලපුරුද්ද කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. එමගින් සුදුසුතම නිලධාරීන් අදාළ තනතුරුවලට තෝරා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලැබී ඇති අතර, එම තෝරා ගැනීම් සාධාරණ හා විනිවිදභාවයකින් යුක්තව කර ගැනීමට හැකිවන පරිදි සම්මුඛ පරීක්ෂණවලදී තෝරා ගැනීමේ නිර්නායක ඇතුළත් ලකුණු පටිපාටි කොමිෂන් සභාව විසින් අනුමත කර සම්මුඛ පරීක්ෂණයට පෙර නිලධාරීන් / අයදුම්කරුවන් වෙත ලැබීමට සලස්වන ලෙස අමාත්‍යංශ ලේකම්වරුන් / ආයතන ප්‍රධානීන් වෙත උපදෙස් ලබා දී ඇත.

ඇතැම් අමාත්‍යංශ හා වෙනත් රාජ්‍ය ආයතනවලින් තොරතුරු ගෙන්වා ගැනීමේ දී සිදුවන ප්‍රමාද අවම කර ගැනීම සඳහා සිහිකැඳවීම් යැවීමට අමතරව එම ආයතනවල අදාළ නිලධාරීන් දුරකථනය මඟින් සම්බන්ධ කරගෙන අවශ්‍ය තොරතුරු නියමිත වේලාවට ඉදිරිපත් නොකිරීමෙන් නිලධාරීන්ට / අයදුම්කරුවන්ට සිදුවිය හැකි අසාධාරණය පිළිබඳව දැනුවත් කිරීමටද කටයුතු කර ඇත. ඒ හේතුවෙන් එවැනි ආයතනවලින් අප්‍රමාදව තොරතුරු ලබාගෙන බොහෝ පත්වීම් හා උසස්වීම් කඩිනමින් ලබාදී ඇත.

ගැටලුකාරී තත්ත්වයන් මතුවූ අවස්ථාවල අදාළ අමාත්‍යංශ ලේකම්වරු හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති ඇතුළු කොමිෂන් සභා සමාජිකයන් ද , රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ඇතුළු ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් ද සමඟ දීර්ඝ වශයෙන් සාකච්ජා කර කිසිදු පාර්ශවයකට අගතියක් නොවන පරිදි පවත්නා නීතිමය රාමුව තුළ එකඟතාවයනට පැමිණෙමින් එම ගැටළු නිරාකරණය කර දීමට කටයුතු කර ඇත.

# විශ්‍රාම ගැන්වීම්

| | | |
|---|---|---|
| 1 | අධ්‍යාපන අමාත්‍යංශය | 157 |
| 2 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 1 |
| 3 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යංශය | 22 |
| 4 | ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යංශය | 3 |
| 5 | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යංශය | 6 |
| 6 | කෘෂිකර්ම අමාත්‍යංශය | 39 |
| 7 | ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යංශය | 5 |
| 8 | ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යංශය | 4 |
| 9 | ජනාධිපති කාර්යාලය | 4 |
| 10 | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යංශය | 2 |
| 11 | තැපැල් සේවා අමාත්‍යංශය | 2 |
| 12 | දේශීය වෛද්‍ය අමාත්‍යංශය | 25 |
| 13 | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යංශය | 6 |
| 14 | ප්‍රවාහන අමාත්‍යංශය | 12 |
| 15 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යංශය | 9 |
| 16 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය | 8 |
| 17 | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශය | 140 |
| 18 | යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යංශය | 27 |
| 19 | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය | 16 |
| 20 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය | 149 |
| 21 | වරාය හා මහාමාර්ග අමාත්‍යංශය | 1 |
